**ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම.** | | |
| මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.150,000 ක ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වර්ෂය තුළ කාර්යාල ගොඩනැගිල්ල මාරුකිරීමට අදහස් කර තිබුණද , අධිකාරයේ කාර්යයන් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් සොයා ගැනීමට නොහැකි වීම හා වෙනත් අවශ්‍යතා පැන නොනැගීම. |
| **(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම** | | |
| වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 71 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වර්ෂය තුළ කාර්යාල ගොඩනැගිල්ල මාරුකිරීමට අදහස් කර තිබුණද , අධිකාරයේ කාර්යයන් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් සොයා ගැනීමට නොහැකි වීම හා වෙනත් අවශ්‍යතා පැන නොනැගීම. |

වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මෙහි අභියාචනයක් ලැබී සති 31 කින් කටයුතු අවසන් කිරීමට සැලැසුම් කර තිබුණත්, ඒ අනුව කටයුතු කිරීමට අධිකාරයට නොහැකි වී තිබුණි. | සැලැසුම් අනුව කටයුතු කළ යුතුය. | පූර්ව අනුමාන දත්තයන් ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ප්‍රායෝගික ගැටළු නිසා යථාපරිදි ක්‍රියාත්මක කිරීම දුෂ්කර වීම. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයේදී අභියාචනා 958 ක කටයුතු කිරීමට තිබුණු අතර වර්ෂය තුළ අභියාචනා 424 ක් ලැබී තිබුණි. අභියාචනා 17 ක් නැවත කැඳවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කටයුතු කළ යුතු මුළු අභියාචනා සංඛ්‍යාව 1399 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අභියාචනා 520 ක කටයුතු අවසන් කර තිබුණු අතර තවත් අභියාචන 879 ක කටයුතු ඉදිරි වර්ෂයේදී කළ යුතුව තිබුණි. | අභියාචනා අවසන් කිරීමට කටයුතු කළ යුතුය ඇත. | ඔබගේ නිරීක්‍ෂණය නිවැරදිය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිගණක උපාංග මිලදී ගැනීමේදී හා වාර්ෂික වාර්තාවේ පිටපත් 110 ක් මුද්‍රණයේදී භාණ්ඩ පිරිවිතරවලට හා වෙනත් එකඟ වූ කොන්දේසිවලට අනුකූලව ලැබුණු බව සහතික කිරීමකින් තොරව හා භාණ්ඩ පරීක්ෂා කර භාරගෙන තිබෙන බව සහතික කිරීමකින් තොරව රු .43,250 ක ගෙවීම් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. | එම රෙගුලාසි පරිදි කටයුතු කිරීම අතපසු වී ඇති බව පිළිගනිමි මින් ඉදිරියට එවැනි තත්ත්වයක් සිදු නොවීමට කටයුතු කරමි. |
| (ආ) | ටෝනර් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩවල විස්තර හා ප්‍රමාණයන් සඳහන් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අඩුපාඩුව සිදුවී ඇති බව පිළිගනිමි. මෙම තත්ත්වය ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරමි. |
| (ඇ) | වානේ මේස අළුත්වැඩියා කිරීමේදී කාර්ය ඉටු කළ බවට සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. | මෙම අඩුපාඩුව පිළිගන්නා අතර ඉදිරියේදී එවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරමි. |
| (ඈ) | වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ හා සෘජු ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ඒ සඳහා සහාය වන නිලධාරීන්ට ගෙවීම් නොකළ යුතුව තිබුණත් ඒ යටතේ කමිටුවේ සාමාජිකයකු වෙත රු.20,000 ක් ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුව ඇත. | ඔබගේ නිරීක්ෂණය නිවැරදි යයි සලකා එම මුදල් ආපසු ගෙවන ලෙස නිලධාරිනියට දන්වා ඇති අතර එම මුදල් ගෙවූ පසු අදාළ ලදුපතෙහි පිටපතක් ඔබ වෙත එවීමට කටයුතු කරමි. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන නිර්ණායකවල තත්ත්වය 2017" නම් වූ ප්‍රකාශනය අනුව තිරසර සංවර්ධන අරමුණු 16.3 හි සියළු දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර් ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම දක්වා ඇත. අධිකාරයද නීතිය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් බැවින් තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අධිකාරයේ අවධානය යොමු විය යුතු වුවත්, ඒ පිළිබඳව අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය. | තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම රජයේ ප්‍රතිපත්තියක් බැවින් එම අරමුණු කරා ළඟා වීමට ආයතනය කටයුතු කළ යුතුය. | සියළු දෙනාට නීතියේ සාධාරණත්වය ලබා දීම සඳහා උපරිම මට්ටමින් ක්‍රියාකරන බව අවධාරණයෙන් යුතුව සඳහන් කරමි. අන්තර් ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීමට මෙම අධිකාරයට අවශ්‍ය නොවනුයේ මෙය රාජ්‍ය නිලධාරීන් හා පොලිස් නිලධාරීන්ගේ ජාතික වෘත්තීය ගැටළුවලදී විසඳුම් ලබා දීමට පමණක් සීමා වී ඇති ආයතනයක් බැවිනි. |